# සාමාජික අයදුම් පත්‍රය (බාහිර පාඨක)
# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
# පුස්තකාලය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

---

01. සම්පූර්ණ නම :- ..............................................................................................................

02. ලිපිනය :- ..............................................................................................................

03. උපන් දිනය :- වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

04. ජාතික හැඳුනුම්පත් අංකය :- [ | | | | | | | | | ]

( ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණන්න)

05. දුරකථන අංකය - ජංගම:- .................................. ස්ථාවර:- .........................................

විද්‍යුත් ලිපිනය :- ................................................

06. ඉගෙනුම ලබන පාඨමාලාව :- ..............................................................................................................

07. ඉගෙනුම ලබන ආයතනය :-..............................................................................................................

08. සේවා ස්ථානයේ නම :-..............................................................................................................

ලිපිනය :-..............................................................................................................

දුරකථන අංකය :- ..........................................

09. මුදල් ගෙවන ලද ලදුපත් අංකය :- ..........................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ නීතිරීති, අණපනත් හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමටත් එකඟ වෙමි.

දිනය :- අත්සන :-

## පාඨමාලා සම්බන්ධීකාරකගේ/ බලයලත් නිලධාරියාගේ නිර්දේශය

ඉහත අය සඳහා පුස්තකාල විමර්ශන පහසුකම් ලබාදීම සුදුසු බව නිර්දේශ කරමි/ නොකරමි.

නම :-

තනතුර :-

ආයතනය :-

අත්සන :-

දිනය :-

---

## පුස්තකාලයාධිකාරිගේ අනුමැතිය

ඉහත අය සඳහා පුස්තකාල විමර්ශන පහසුකම් ලබාදීම සුදුසු බව අනුමත කරමි / නොකරමි.

අත්සන :-

දිනය :-

## බාහිර පාර්ශවයන් සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයීය පුස්තකාලයෙන් පාඨක සේවා සැපයීම.

ඉහත කරුණු සම්බන්ධයෙන් පුස්තකාලයාධිකාරී වෙත ලැබුණු ඉල්ලීම් පුස්තකාල කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි. මෙම විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා/ ඩිප්ලෝමා පාඨමාලා / සහතික පත්‍ර පාඨමාලා හදාරන අය සඳහා මෙම ඉල්ලීම් ලැබී තිබිණ. මෙම ඉල්ලීම් සලකා බැලීම සඳහා 2017.01.26 දින පැවති අංක 42 දරන පුස්තකාල කමිටුවට සහ 2017.02.17 දින පැවති අංක 147 දරන සනාතන සභා රැස්වීමට මේ සම්බන්ධව විස්තර සපයන ලදි. එම සනාතන සභා රැස්වීමේ දී මේ පිළිබඳව සාකච්ඡාවට ගත් අතර ඒ සඳහා නිර්ණායක සකසා පුස්තකාල කමිටුව මගින් සනාතන සභාව වෙත එවන ලෙස වැඩ බලන පුස්තකාලයාධිකාරීට උපදෙස් ලැබිණ. ඒ අනුව සකසන ලද නිර්ණායක කෙටුම්පත 2017.02.15 දින පැවති අංක 43 දරන පුස්තකාල කමිටුවට පුස්තකාලයාධිකාරී (වැ.බ) විසින් ඉදිරිපත් කරන ලදි. එය එහි දී සාකච්ඡාවට ගෙන සංශෝධන  කිරීමෙන් අනතුරුව සකසන ලද නිර්ණායක 2017.02.17 දින පැවැත්වෙන සනාතන සභාවට පත්‍රිකාවක් මගින් ඉදිරිපත් කරන ලෙසට වැඩ බලන පුස්තකාලයාධිකාරී වෙත පුස්තකාල කමිටුවෙන් උපදෙස් ලැබිණ. එම නිර්ණායක සහ අයදුම් පත්‍රයේ ආකෘතිය මේ සමග ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කරමි.

1. පුස්තකාලයේ තාවකාලික විමර්ශන සාමාජිකත්වය ලැබිය හැකි වන්නේ පහත දැක්වෙන අය සඳහා වේ.
   පිරිවෙන් ගුරුවරු, ප්‍රාචීන මධ්‍යම හා අවසාන පරීක්ෂණ සඳහා සූදානම්වන අය, වෙනත් විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි පාඨමාලා හදාරන අය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලාව, ඩිප්ලෝමා පාඨමාලා සහ සහතිකපත්‍ර පාඨමාලා සඳහා ලියාපදිංචි අය.
2. ඉල්ලුම්කරු ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලාව/ ඩිප්ලෝමා පාඨමාලා/ සහතික පත්‍ර පාඨමාලාවට අදළ වේ නම්  එම පාඨමාලාවේ සම්බන්ධිකාරකගෙන් පුස්තකාල පහසුකම් ලබා ගැනීම සඳහා නිර්දේශය ලිඛිතව ලබාගත යුතු ය.
3. පිරිවෙන් ගුරුවරු හා සිසුන් සහ වෙනත් විශ්වවිද්‍යාලයවල පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි අය එම ආයතනයේ පරිවේණාධිපති/අධ්‍යයන අංශ ප්‍රධානගේ නිර්දේශය සහිත ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.
4. නිර්දේශය ලත් අය විසින් පුස්තකාල ගාස්තු වශයෙන් රුපියල් දෙදහසක් (2000.00) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සරප් වෙත තැන්පත් කිරීමෙන් අනතුරුව එම ලදුපත පුස්තකාලයට අදාළ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය. මෙම මුදල සාමාජිකත්වය ඉවත්කර ගන්නා විට නැවත ගෙවනු ලැබේ.
5. සාමාජිකයන්ගෙන් පුස්තකාල සම්පත්වලට කිසියම් හානියක් සිදුව ඇත්නම් ඉහත තැන්පත් මුදලින් එය පියවා ගැනීමට පුස්තකාලය මගින් කටයුතු කරනු ලැබේ.
6. පුස්තකාලයෙන් ලබා දෙනුයේ විමර්ශන පහසුකම් පමණි.
7. අදළ ඉල්ලුම්කරුගේ පාඨමාලාව වලංගු කාලය සඳහා පමණක් විමර්ශන පහසුකම් ලබාගත හැකි ය.
8. පුස්තකාලය විවෘතව පවත්නා දිනයන්හි පමණක් මෙම සේවාව ලබා දීම සිදුකරනු ලැබෙයි. එය පෙ.ව 8.30 සිට ප.ව 4.00 කාලය දක්වා වලංගු ය.
9. ඉල්ලුම්පත්‍රය සමග අඟල් 2 X 2 ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් පුස්තකාලය වෙත ලබාදිය යුතු වේ. ( ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ලියාපදිංචිව හැඳුනුම්පත් ලත් අයට මෙය අදාළ නොවේ.)
10. පුස්තකාල සාමාජිකත්වය ලද පසු අනන්‍යතා සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ.
11. ඉල්ලුම්කරු පුස්තකාලයේ සෙසු පාඨක පිරිස්වලට බාධාවක් නොවන පරිදි කටයුතු කළ යුතු ය .
12. පුස්තකාලයේ පොදු නීතිරීති සහ ක්‍රියා පටිපාටියට අදළව කටයුතු කිරීම කළ යුතු ය.

SLBU/L/2017/08

පුස්තකාලය,

2017.02.17.

අතිගරු මහෝපාධ්‍යායයන් වහන්සේ,

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,

අනුරාධපුර.

ගරු මහෝපාධ්‍යායයන් වහන්ස,

2017.02.15 දින පැවති අංක 43 දරන පුස්තකාලය කමිටුවේ තීරණ පරිදි වැඩ බලන පුස්තකාලයාධිකාරි වෙත ලැබුණු උපදෙස් අනුව අදළ පත්‍රිකාව මේ සමග ඉදිරිපත් කරමි.

මෙයට

වැ.බ. පුස්තකාලයාධිකාරි.

දැනට විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි අයට මෙය අදාළ නොවේ.